රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2019

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව

අංක : 748, මරදාන පාර,
කොළඹ.
0112694381
0112694382
ෆැක්ස් : 0112694383
විද්‍යුත් තැපැල : cv@valuationdept.gov.lk

ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා
මුදල් අමාත්‍ය

ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමා
මුදල් රාජ්‍ය අමාත්‍ය

එස්.ආර්. ආටිගල මහතා
මහා භාණ්ඩාගාර ලේකම්

පී.ඩී.ඩී.එස්. මුතුකුමාරණ මහත්මිය

රජයේ ප්‍රධාන තක්සේරුකරු

පටුන

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ 1

1.1 හැඳින්වීම 1
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ මූලික වගකීම් 3
1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාදාමයන් 4
1.4 සංවිධාන සටන 6
1.5 තක්සේරු කාර්යාල 7
1.6 මූල්‍යමය කාර්යකරණය සහ විශ්ලේෂණය 8

2 පරිච්ඡේදය - කාර්යසාධනය සහ ප්‍රගතිය 9

2.1 ප්‍රාග්ධන තක්සේරු 9
2.2 කුලී තක්සේරු කිරීම් 10
2.3 නිම කළ සාමාන්‍ය තක්සේරු කිරීම් - වර්ෂමය හා ප්‍රක්ෂේපිත 11
2.4 ඉලක්කගත - නිම කළ - ප්‍රක්ෂේපිත සාමාන්‍ය තක්සේරු කිරීම් 12
2.5 වරිපනම් තක්සේරු 13
2.6 ප්‍රති වරිපනම් තක්සේරු කටයුතු – වසරමය සහ ප්‍රක්ෂේපිත 14
2.7 වරිපනම් ආශ්‍රිත තක්සේරු කටයුතු 15
2.8 ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඩු විස්තරය 17
2.9 වත්කම් අංශයේ තක්සේරු කටයුතු පිළිබඳ ලුහුඩු විස්තරය 18
2.10 තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුල ඉටු කරන ලද විශේෂ ව්‍යාපෘති වල සාරාංශය 19
2.11 අධ්‍යාපනික උන්නතිය 23

3 පරිච්ඡේදය – වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 25

3.1 **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය25
3.2 **2019** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය ....Error! Bookmark not defined.
3.3 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 27
3.4 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 30
3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 30
3.6 විගණකාධිපතිවරයාගේ වාර්තාව 30

4 පරිච්ඡේදය – කාර්යසාධන දර්ශක 31

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක 31

5 පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය32

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 32

6 පරිච්ඡේදය – මානව සම්පත් පැතිකඩ 33

6.1 සේවක සංඛ්‍යා කලමනාකරණය.. 33

6.2 2019 වසර තුළ තක්සේරු නිලධාරීන්ගේ හිගය නිසා මාසයක් පාසා නිම කිරීමට නොහැකිව ඉතිරි වූ ගොනු ප්‍රමාණය 34

6.3 මානව සම්පත් සංවර්ධනය.. 35

7 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව 39

8 ඇමුණුම්

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වර්ෂ 1815 දී මෙරට පුරා ව්‍යාප්තව ස්ථාපිත වූ බ්‍රිතාන්‍යයීය පාලනය රටේ ඉඩම් අයිතිය, ඉඩම් පරිහරණය සහ ඉඩම් හිමිකාරිත්වය යන කරුණු රටාව විෂයයෙහි වෙනස්කම් රැගෙන ආවේ ය. 1863 අංක 2 දරණ ආඥා පනත "පොදු පරිහරණය පිණිස පුද්ගලික ඉඩම්වල සන්තකය ලබා ගැනීමටත්, ඉඩම් මැන සමීක්ෂණය කර තක්සේරු කිරීමටත් කිරීටයට හැකි වන්නා වූ ආඥා පනතකි." යනුවෙන් නීතිමය හිමිකම් පවරා ගත්තේ ය. රජයේ දේපළ වල වාර්ෂික තක්සේරුවක් කිරීමටත්, නාගරික ප්‍රදේශවල පිහිටි නිශ්වල දේපළ තක්සේරු කිරීමටත්, ඉඩම් වලට අදාළ වෙනත් තක්සේරු කටයුතු කිරීමටත් 1921 ජූනි මස 1 වන දින පළාත් පාලන මණ්ඩලයක් පිහිටුවන ලදි. රජයේ තක්සේරුකරු තනතුර සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා වූ ප්‍රතිපාදන පළාත් පාලන මණ්ඩලය යටතේ වෙන් කරන ලද අතර කිරීටය සතු දේපළ තක්සේරු කිරීම, බූදල් බදු අගයා තක්සේරු කිරීම සහ ප්‍රාදේශීය බල මණ්ඩලවලට අයත් ඉඩම් අත්පත් කර ගැනීම හා ඒවායේ අගය තක්සේරු කිරීම යනාදී කාර්යයන් භාරව කටයුතු කරනු පිණිස රජයේ තක්සේරුකරු තනතුර 1923 වර්ෂයේ දී ඇති කරන ලදි.

වර්ෂ 1939 දී, භාණ්ඩාගාරයේ තක්සේරු අංශය සහ පළාත් පාලන තක්සේරුකරුවන්ගේ දෙපාර්තමේන්තුව යනුවෙන් වූ ආයතන දෙකක් රජය වෙනුවෙන් තක්සේරු කටයුතු වල නිරතව සිටියේ ය. වියදම් කපා හැරීමේ ක්‍රියා මාර්ගයක් ලෙස ඉහත සඳහන් ඒකක දෙක ඒකාබද්ධ කර අභිනව දෙපාර්තමේන්තුවක් යටතේ එක් නිලධරයෙකු භාරයේ තැබීමට තීරණය කෙරුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 1939 ඔක්තෝබර් මාසයේ දී ප්‍රධාන තක්සේරුකරු ලෙස කපිතාන් ඊ.ජී. ඊස්ට්මන් මහතා පත් කරනු ලැබිණි.

මෙම කාලය අතරතුර තක්සේරු කටයුතු ක්ෂේත්‍රයේ වෘත්තීයමය තත්ත්වය ඔසවා තැබීමේ අරමුණ පෙරදැරිව තක්සේරුකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ලංකා කාර්මික විද්‍යාලයෙහි ආරම්භ කරන ලදි. තක්සේරුකරුවන් සඳහා වූ වෘත්තීය අධ්‍යයන පාඨමාලාවක් වන දේපළ කළමනාකරණය පිළිබඳ උපාධිය 1972 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආරම්භ කර, පසුව ඊළඟ වර්ෂයේ සිට එම උපාධිය විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙහි ද (දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය) ඉගැන්වීම ඇරැඹිණි. අද වන විට ද, තක්සේරු දෙපාර්තමේන්තුවට වෘත්තිකයන් බිහි කර දෙන ප්‍රධාන ප්‍රභවය වන්නේ මෙයයි. දෙපාර්තමේන්තුවට කෙරෙන මූලික බඳවා ගැනීම්හි මට්ටම උපාධි මට්ටම දක්වා ඉහළ දැමුණු අතර මේ වන විට දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලබන්නේ දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය දරන්නන් පමණි.

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙරට සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සුවිශේෂී දායකත්වයක් සපයන බව පොදු මහජනතාව විෂයෙහි ප්‍රකට කරුණකි. වසර 95 කටත් අධික ඉතිහාසයක් සපුරා සිටි

අපගේ පූර්වානුගාමිකයෝ ඔවුන්ගේ විචක්ෂණ දැනුම හා ප්‍රගුණතාව සමගින් තක්සේරුකරණය හා දේපළ කළමනාකරණය පිළිබඳ සම්ප්‍රදායන් සහ උසස් ප්‍රමිතීන් පවත්වා ගනු ලබන රාජ්‍ය අංශය තුළ පවත්නා කීර්තිමත් වෘත්තීය ආයතනයක් අප වෙත උරුම කර තබා ගියහ. ඔවුන් සිය කැපවීම තුළින් හා නිසි ගරුත්වය සහ අධි වෘත්තීය භාවය මතින් ගොඩ නැගූ ක්‍රමවේදයන් ඔස්සේ අප හට විද්‍යාමාන කරනුයේ, සේවා සැපයීමෙහිලා වෘත්තීය මට්ටමේ හා ඉහළම ගණයේ තක්සේරුකරුවන් ලෙස කෙතරම් විශිෂ්ට අයුරින් අප කටයුතු කළ යුතු ද යන්නයි.

මෙම කාර්ය සාධන හා ගිණුම් දැක්වීමේ වාර්තාව, අප තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන සැලැස්මෙහි නියම කරනු ලැබ ඇති ඉලක්ක හා අරමුණු එල්ලේ තථ්‍ය ප්‍රතිඵල සංසන්දනාත්මකව දැක්වෙන එහි පරමාර්ථ හා කර්තව්‍යයන් ද, එහි කාර්ය සාධන ක්‍රියා මාර්ගවල හා ප්‍රගතියේ සුවිශේෂ අවස්ථා ද විදහා දැක්වෙන පූර්විකාවේ කූඨ ප්‍රාප්තියයි. එම කටයුතු, මෙරට සමාජ ආර්ථික සංවර්ධනය උදෙසාත්, දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය උදෙසාත් දායක කරගනු පිණිස සහය සලසා ගැනීමේ අටියෙන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්යයන් වන්නේ ය. අදාළ සැලසුම් උපායමාර්ග නොකඩවා ඉටු කිරීම ආරම්භ කරමින් ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශය යටතේ ස්වකීය අය වැය ලේඛනය ක්‍රමානුයෝජනය, එහි වැඩ ඉටු කිරීම හා ඊට සාධාරණය සැලසෙන අයුරින් කටයුතු කිරීම යන කාර්යයන් තක්සේරු දෙපාර්තමේන්තුව ඉෂ්ට සිද්ධ කළේය. මෙම වාර්තාව පිළියෙළ කෙරෙනුයේ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසිවලට අයත් නියමයන්ට අනුකූලව වන අතර 2019 වර්ෂය තුළ තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය කටයුතු මින් ආවරණය කරනු ලැබේ.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණ සහ මූලික වගකීම්

"අපගේ දැක්ම"

"නිශ්චල දේපළ තක්සේරුකරණ සහ කළමනාකරණ විෂයයෙහිලා ගෝලීය ප්‍රමිතීන් පදනම් වූ ප්‍රශස්ත වෘත්තීයමය සේවාවන් තුළින් සමාජ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම"

"අපගේ මෙහෙවර"

"කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණ ව්‍යුහයක් තුළින් තරඟකාරීව මෙන්ම පිරිවැය පිළිබඳ සවිඥාණිකව ශ්‍රී ලංකා රජයට පූර්ණ වෘත්තීයමය තක්සේරු හා දේපළ කළමනාකරණ සේවාවන් සැපයීම."

"අපගේ අරමුණ"

"මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු වනුයේ සේවාදායකයින් වෙත ප්‍රතිඵල සාධනය ඉලක්ක කරගත් විශිෂ්ටතම කාර්ය චර්යා ප්‍රමිතීන් මත පිහිටා උසස් වෘත්තීයමය සේවාවන් සැපයීමයි."

"අපගේ මූලික වගකීම්"

"තක්සේරු දෙපාර්තමේන්තුව, තම ව්‍යවස්ථාපිත වගකීම් හැරුණු විට, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන උදෙසා විස්තීර්ණ තක්සේරු සේවාවන් හා දේපළ කළමනාකරණ සේවාවන් සැපයීමේ වගකීම උසුලයි."

1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාදාමයන්

දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් වර්ගීකරණය කළ හැකි ය.

1. 1950 අංක 09 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා වූ අනිවාර්ය අත්කර ගැනීම් වලදී, එම පනතේ 17(1) වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි තක්සේරු වාර්තා පිළියෙළ කිරීම.
2. ඉඩම් අත්කරගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ හදිසි සංවර්ධන කාර්ය කටයුතු උදෙසා අත්කර ගනු ලබන ඉඩම්වල ඉදිරි වන්දි තක්සේරු සඳහා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම.
3. ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යථා කාලයේදී කෙරෙන දේපළ අත්කරගැනීම් සඳහා වන්දිමුදල් ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීම උදෙසා දේපළ ඇස්තමේන්තු තක්සේරු වාර්තා පිළියෙළ කිරීම.
4. ඉඩම් අත්කරගැනීමේ පනතේ 63(2) (ඊ) යටතේ පැනවූ 2008 රෙගුලාසි යටතේ හිමිකම් පරීක්ෂණ සඳහා වන්දි උපදේශන සේවා ලබා දීම.
5. පුද්ගලික ගිවිසුම් මත දේපළ මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම මෙන්ම බදු කාර්යයන් උදෙසා සහ වෙනත් විවිධ කාර්යයන් සඳහා චංචල හා නිශ්චල දේපළ තක්සේරු කිරීම.
6. අල්ලස් පනත, මුද්දර බදු පනත සහ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත වැනි ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යටතේ බලය ලබා දී ඇති තක්සේරු කිරීම් සිදු කරන ලෙස ප්‍රධාන තක්සේරුකරු හට නියම වූ විට අදාළ දේපළ තක්සේරු කිරීම.
7. රජයේ හා රාජ්‍ය ආයතනවල දේපළ පුද්ගලික අංශයට කුලියට දීම සහ පුද්ගලික දේපළ රජයට සහ රාජ්‍ය අනුබද්ධ ආයතනවලට කුලියට ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා කුලී තක්සේරු සැපයීම.
8. රජයේ නිවාසවල පදිංචි වී සිටින රජයේ සේවකයින්ගෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයට අනුව එම නිවාස කුලී හෝ දණ්ඩන කුලී අය කර ගැනීම සඳහා කුලී තක්සේරු සැපයීම.
9. මහ භාණ්ඩාගාරයේ ඉල්ලීම මත, රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරු කටයුතු ද සිදුකිරීම.
10. ආපදා කළමනාකරණ තත්ත්ව කාර්යයන් යටතේ වන්දි තක්සේරු කිරීම.
11. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ගිණුම්කරණ කාර්යයන් සඳහා වත්කම් තක්සේරු කිරීම.

12. කොළඹ මහනගර සභා සීමාව තුළ පිහිටි දේපළ හැර දිවයිනේ වරිපනම් බදු අය කෙරෙන සියලුම පළාත් පාලන ආයතනයන්ට අයත් දේපළවල වරිපනම් බදු අයකිරීමේ කාර්යය උදෙසා වසර 5 කට වරක් තක්සේරු කරනු ලබන අතර, ඊට අතෘප්තිමත් පුද්ගලයින් විසින් වරිපනම් තක්සේරු වලට එරෙහිව ඉදිරිපත් කෙරෙන විරෝධතා පිළිබඳ නිශ්චය කිරීමේ දී වෘත්තීය සහය දැක්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබේ. එම පළාත් පාලන ආයතනවල වසර 5 අතරතුර හිමිකම් වෙනස්වීම් වලට හා නව ඉදිකිරීම් වලට අදාලව වරිපනම් බදු අය කර ගැනීම සඳහාද වාර්තා ලබා දීම.
13. කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි කිරීටය සතු දේපළවල වාර්ෂික වටිනාකම් ප්‍රධාන තක්සේරුකරුගේ අනුමැතිය සහිතව කොළඹ මහ නගර සභාව විසින් තක්සේරු කටයුතු කිරීම.
14. වන්දි මුදල් හා තක්සේරු ආරවුල් විභාග කර විසඳුම් ලබා දෙන අධිකරණවලට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට විශේෂඥ සාක්ෂ්‍ය සැපයීම මගින් සහය වන අතර දෙපාර්තමේන්තු නිලධාරීන්, ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් ගෙවල් කුලී පනත යටතේ ස්ථාපිත ගෙවල් කුලී මණ්ඩලවල, අත්කර ගැනීම් පනත යටතේ වන වන්දි සමාලෝචන මණ්ඩලවල,ඉඩම් අත්කර ගැනීමේ ප්‍රතිස්ථාපන කමිටුවල සහ ඉඩම් අත්කර ගැනීමේ ප්‍රතිස්ථාපන කමිටුව - අමාත්‍යාංශ විශේෂ අභියාචනා කමිටුවල නිල බලය ලත් සාමජිකයන් වශයෙන් සහභාගි වීම.

1.4 සංවිධාන සටහන


ප්‍රධාන තක්සේරුකරු
අතිරේක ප්‍රධාන තක්සේරුකරු - 04
නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු - 16
ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු - 80
තක්සේරුකරු - 120
සහකාර තක්සේරුකරු - 360
තක්සේරු සේවය
අධ්‍යක්ෂ (පරිපාලන) - 01
ප්‍රධාන ගණකාධිකාරී - 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක - 01
ගණකාධිකාරී - 01
නීති නිලධාරී - 02
පරිපාලන නිලධාරී - 02
තොරතුරු හා සන්නිවේදන නිලධාරී - 02
සංවර්ධන නිලධාරී - 25
කළමනාකරණ සහකාර නිලධාරී - 105
කාර්යාල කාර්ය සහායක - 76
රියදුරු - 21
අනෙකුත් සේවය

1.5 තක්සේරු කාර්යාල

තක්සේරු කාර්යාලය	දුරකතන අංකය		විද්‍යුත් තැපැල	ෆැක්ස්
	ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු	තක්සේරුකරු		
මහ කොළඹ	0112674477	0112674478	valdept.metro@gmail.com	0112674477
බටහිර මධ්‍යම	0112698688	0112695905	valdept.west.central@gmail.com	0112698688
බටහිර උතුර	0332221064	0332223869	valdept.west.north@gmail.com	0332221064
බටහිර දකුණ	0342222643	0342222655	valdept.west.south@gmail.com	0342222643
මධ්‍යම I	0812222559	0812222556	valdept.central1@gmail.com	0812222559
මධ්‍යම II	0812211166	0812211165	valdept.central2@gmail.com	0812211166
ගාල්ල	0912222612	0912222612	valdept.galle@gmail.com	0912222612
මාතර	0412223016	0412222612	valdept.southern@gmail.com	0412223016
හම්බන්තොට	0472225612	0472225612	valdept.southernsub@gmail.com	0472225612
උතුරු මැද	0252234035	0252234036	valdept.north.central@gmail.com	0252234035
වයඹ	0372225280	0372225280	valdept.north.west@gmail.com	0372225280
සබරගමුව	0452226845	0452226985	valdept.sabaragamuwa@gmail.com	0452226845
ඌව	0552222486	0552224153	valdept.uva@gmail.com	0552222486
නැගෙනහිර	0652225646	0652223469	valdept.eastern@gmail.com	0652223469
උතුර	0212224957	0212224957	valdept.northern@hotmail.com	0212224957

1.6 මූල්‍යමය කාර්යකරණය සහ විශ්ලේෂණය

මූල්‍යමය කාර්යකරණය මැනීම සහ වාර්තාකරණය

	2015	2016	2017	2018	2019
සත්‍ය ගාස්තු (රු.)	53,047,155.00	132,085,894.53	164,110,234.13	142,902,142.00	277,137,469
කල්පිත ගාස්තු (රු.)	60,000,000.00	60,000,000.00	75,000,000.00	80,000,000.00	807,239,233



2 පරිච්ඡේදය - කාර්යසාධනය සහ ප්‍රගතිය

2.1 ප්‍රාග්ධන තක්සේරු

i. <u>1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ තක්සේරු කිරීම්</u>

අ) ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ ඉඩම් අත්කර ගැනීමට නියමිත අවස්ථාවල දී ගෙවිය යුතු වන්දි වෙන්කිරීම් සඳහා තක්සේරු පිළියෙළ කිරීම.

1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමට යෝජිත ඉඩම්වලට අදාළ අරමුදල් වෙන්කර ගැනීම සඳහා දේපළ ඒකක 1,146 ක ඇස්තමේන්තු තක්සේරු කටයුතු 2019 වර්ෂය තුළදී නිම කරන ලදි.

ආ) ඉඩම් අත්කරගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ හදිසි සංවර්ධන කාර්ය කටයුතු උදෙසා අත්කර ගනු ලබන ඉඩම් සඳහා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වන වගන්තිය යටතේ සන්තකය රජය වෙත පවරා දෙනු ලැබ ඇති ඉඩම් සම්බන්ධයෙන් තත්ත්ව වාර්තා 5,258 ක ප්‍රමාණයක් පිළියෙළ කරනු ලැබ තිබේ.

ඇ) ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ පොදු කාර්ය කටයුතු සඳහා අනිවාර්යයෙන් ම ඉඩම් අත්කර ගනු ලැබ ඇති සම්බන්ධිත පාර්ශව සඳහා ගෙවිය යුතු වන්දි පිළිබඳව වූ තක්සේරු කිරීම් පිළියෙල කිරීම.

අත්කර ගැනීමේ නිලධාරින් විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 (1) වන වගන්තිය අනුව කළ යුතු වන්දි ප්‍රදානයන් උදෙසා දේපළ ඒකක 14,517 ක් වෙනුවෙන් වූ තක්සේරු කිරීමේ කටයුතු 2019 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් නිම කරනු ලැබ තිබේ.



ii. <u>විවිධ කාර්යයන් සඳහා නිශ්චල හා චංචල දේපළ තක්සේරු කිරීම</u>

අ) දිගු කාලීන හා කෙටි කාලීන බදුකර සඳහා රජයේ ඉඩම් තක්සේරු කිරීම.
ආ) ගිණුම්කරණ කාර්යයන් සඳහා රාජ්‍ය හා ආයතනික වත්කම් තක්සේරු කිරීම.
ඇ) පුද්ගලික ගිවිසුම් යටතේ දේපළ මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම.
ඈ) දෙපාර්තමේන්තුව, වන්දි මුදල් හා තක්සේරු ආරවුල් විභාග කර තීරණ ලබා දෙන අධිකරණවලට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට විශේෂඥ සාක්ෂ්‍ය සැපයීම මගින් සහය වේ.

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල වත්කම් තක්සේරු කිරීමේ කටයුතු ඇතුළුව දේපළ ඒකක 36,423 කට අයත් විවිධ තක්සේරු කිරීම් ප්‍රමාණයක් 2019 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් නිම කරනු ලැබ තිබේ.



iii. <u>අල්ලස් පනත යටතේ තක්සේරු කිරීම්</u>

2019 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් අල්ලස් කොමසාරිස්වරයා වෙත දේපළ ඒකක 6 කට අයත් තක්සේරු කිරීම් ප්‍රමාණයක් වාර්තා කරනු ලැබ තිබේ.

iv. <u>මුද්දර බදු යටතේ තක්සේරු කිරීම්</u>

මුද්දර බදු කාර්යයන් සඳහා දේපළ ඒකක 49 ක ප්‍රමාණයක් තක්සේරු කරනු ලැබ තිබේ.

2.2 කුලී තක්සේරු කිරීම්

iv. <u>රජයේ දේපළ සම්බන්ධයෙන් මාසික කුලී තීරණය කිරීම</u>

2019 වර්ෂය තුළ දී, දේපළ 9,133 කට අයත් කුලී තක්සේරු කිරීම් ප්‍රමාණයක් රජයට සහ අනෙකුත් ආයතන වෙත, ඔවුන්ගේ දේපළ හිමිකම් කුලියට දීමට හඳුනා ගනු ලැබ ඇති අවස්ථාවල දී හෝ එසේ නැතහොත්, එකී ආයතනවලට ස්වකීය පරිහරණය හා වාසය පිණිස පුද්ගලික දේපළ අවැසි වන අවස්ථාවල දී හෝ, සපයනු ලැබ තිබේ.

v. <u>ආයතන සංග්‍රහය යටතේ රජයේ නිවාස සඳහා ආර්ථික කුලී</u>

ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5.1 සහ 7.1 වගන්ති අනුව, 2019 වර්ෂය තුළ දී, දේපළ 3,650 ක් සම්බන්ධයෙන් වූ ආර්ථික කුලී හා දණ්ඩන කුලී පිළිබඳව වාර්තා කරනු ලැබ තිබේ.

2.3 නිම කළ සාමාන්‍ය තක්සේරු කිරීම් - වර්ෂමය හා ප්‍රක්ෂේපිත

තක්සේරු වර්ගය	2015	2016	2017	2018	2019	2020
තත්ත්ව වාර්තා	8092	23389	11036	5243	5258	7167
ඉඩම් අත්කර ගැනීම්	15639	20045	21280	19454	14517	18376
ඉඩම් ඇස්තමේන්තු	648	1032	1471	970	1146	1182
ඉඩම් විවිධ	33222	41987	56931	46198	36423	40706
කුලී පුද්ගලික	7619	8912	11149	9184	9133	9539
කුලී රජය	4094	4132	4230	5949	3650	4835



* මුද්දර බදු සහ අල්ලස් කොමසාරිස් වෙත වාර්තා පෙන්නුම් කර නොමැත.

2.4 ඉලක්කගත - නිම කළ - ප්‍රක්ෂේපිත සාමාන්‍ය තක්සේරු කිරීම්

	2019 ඉලක්කගත	2019 නිම කළ
තත්ත්ව වාර්තා	4304	5258
ඉඩම් අත්කර ගැනීම්	18143	14517
ඉඩම් ඇස්තමේන්තු	1298	1146
ඉඩම් විවිධ	37263	36423
කුලී පුද්ගලික	9201	9133
කුලී රජය	5088	3650



2.5 වරිපනම් තක්සේරු

මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යටතේ ගැනෙන ඔවුන්ගේ ප්‍රාදේශීක බදු අයකර ගැනීමට ඔවුනට හැකි වනු පිණිස දේපළ 269,293 ක මූලික සමීක්ෂණ ද, දේපළ 256,983 ක අවසන් පරීක්ෂණ ද, විශේෂ දේපළ 1,823 ක අවසන් පරීක්ෂණ ද සම්පූර්ණ කරමින් සැලකිය යුතු ප්‍රමාණයක් වූ දේපළ ගණනාවක වරිපනම් තක්සේරු කටයුතු නිමකර දීමට 2019 වසර තුළ දී දෙපාර්තමේන්තුවට හැකි විය.

ප්‍රති වරිපනම් - 2019 ඉලක්ක ගත < 2019 නිම කළ >2020 ප්‍රක්ෂේපිත



2.6 ප්‍රති වරිපනම් තක්සේරු කටයුතු – වසරමය සහ ප්‍රක්ෂේපිත

	2015	2016	2017	2018	2019	2020
මූලික සමීක්ෂණ	119539	176319	183632	194623	269293	737434
අවසන් පරීක්ෂණ	150455	166155	194527	215071	256983	794496
මූලික සමීක්ෂණ සහ අවසන් පරීක්ෂණ						575881



2.7 වරිපනම් ආශ්‍රිත තක්සේරු කටයුතු

2019 වසර තුළ, ඉඩම් ප්‍රතිවරිපනම් තක්සේරු 26,572 ක් වූ ප්‍රමාණයක්ද, ගොඩනැගිලි ප්‍රතිවරිපනම් තක්සේරු 2,938 ක් වූ ප්‍රමාණයක් ද, ඒකක 6,070 ක් සඳහා වූ ප්‍රතිවරිපනම් තක්සේරු විරෝධතා ප්‍රමාණයක් ද සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව සමත් විය.



වරිපනම් තක්සේරු ආශ්‍රිත කටයුතු - ඉලක්කගත - නිම කළ - ප්‍රක්ෂේපිත

	2019 ඉලක්කගත	2019 නිම කළ	2020 ප්‍රක්ෂේපිත
ඉඩම් ප්‍රතිවරිපනම් තක්සේරු	27038	26572	22985
ගොඩනැගිලි ප්‍රතිවරිපනම් තක්සේරු	2816	2938	2702
වරිපනම් තක්සේරු විරෝධතා	7012	6070	5975



2.8 ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරය

අනිවාර්ය දේපළ අත් කර ගැනීම යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් වන බවට සෑහීමට නොපත් පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීමේ කාර්යය සඳහා 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ස්ථාපිත ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත දෙපාර්තමේන්තුවේ නීති අංශය සහය සලසා දෙයි.

අභියාචනා කළමනාකරණ කටයුතු ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය

	2015	2016	2017	2018	2019
වසර මුල ඉතිරිය	2216	178	179	236	1629
වසර තුළ ලද සංඛ්‍යාව	558	215	92	293	444
විභාග කළ මුළු සංඛ්‍යාව	2333	1407	393	529	2073



වසර තුළ ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය විසින් මෙහෙයවන ලද අභියාචනා වල සම්පිණ්ඩනය

අභියාචනා වර්ගය	ලද ගණන	විභාග කළ
ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය	2073	320
ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ කටයුතු කරන ලද අභියාචනා	16	1
අභියාචනාධිකරණය ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා	10	0
මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා	4	0
දිසා අධිකරණ ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා	42	0

2.9 වත්කම් අංශයේ තක්සේරු කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරය

රජයේ අයිතිය යටතේ පවත්නා සියලුම නිශ්චල දේපළ තක්සේරු කිරීමේ කාර්ය භාරය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත පවරා දෙනු ලැබ ඇති අතර එම ක්‍රියාදාමය ඒ සඳහාම ස්ථාපනය කළ රාජ්‍ය වත්කම් තක්සේරු කිරීමේ ඒකකය මගින් කඩිනම් ව්‍යාපෘතියක් ලෙස අතිරේක කාර්ය මණ්ඩල ද බඳවා ගනිමින් ඔවුන්ගේ ද සහය ඇතිව ඉටු කරනු ලැබේ. 2019 වර්ෂය තුළ දී, පහත දැක්වෙන කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබ ඇත.

- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 39 කට අයත් රාජ්‍ය වත්කම් තක්සේරුවලට අදාළ ලිපි ගොනු 666 ක කටයුතු ඉටු කරන ලද අතර ඉන් ලිපි ගොනු 610 ක් යටතේ මුළු දේපළ ඒකක 4081 කට අදාළ වත්කම් තක්සේරු කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී සාර්ථක ලෙස සපුරා ගන්නා ලදි.

- සංස්ථාගත ආයතන 21 කට අයත් ආයතනික වත්කම් තක්සේරු කිරීමේ කටයුතු වලට අදාළ ලිපි ගොනු 191 ක කටයුතු ද, ඉන් ලිපි ගොනු 148 ක් යටතේ මුළු දේපළ ඒකක 1695 කට අදාළ වත්කම් තක්සේරු කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුළ දී විධිමත් පරිදි ඉටු කරන ලදි.

2.10 තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුල ඉටු කරන ලද විශේෂ ව්‍යාපෘති වල සාරාංශය

මෑත වර්ෂ කිහිපය තුළ ශ්‍රී ලංකාවේ රාෂ්ටීය සන්දර්භය තුළ සිදුවූ වෙනස්කම් බොහෝය. රාජ්‍ය ප්‍රතිපත්ති වලට හා ආර්ථික ප්‍රතිසංස්කරණ වලට අනුගත වෙමින් රටේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා රජය විසින් විවිධ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත. එම සංවර්ධන ක්‍රියාවලිය බාධා විරහිතව ක්‍රියාවට නැංවීම පිණිස ශ්‍රී ලංකා රජය වෙත පරිපූර්ණ අධි වෘත්තීයමය තක්සේරුකරණ හා දේපළ කළමනාකරණ සේවා මහ පරිමාණ වශයෙන් සලසා දීම අරබයා තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් අතර දිවයින පුරා විවිධ විශේෂ අංශ ආශ්‍රිතව බිහිවූ ව්‍යාපාරික හා තාක්ෂණික සංවර්ධන ප්‍රදේශ, ජාතික ආර්ථිකය හා ජාතික ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම සඳහා වූ මහා මාර්ග ව්‍යාපෘති මෙන්ම සංචාරක කලාපවල සිදුකරන ලද සංවර්ධන කටයුතු ද වූයේය. තක්සේරු දෙපාර්තමේන්තුව මෙම විශේෂ ව්‍යාපෘතිවලට අයත් සියලුම ඉඩම් කැබලි හා සම්බන්ධ ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටු රැස්වීම් වලට සහභාගි වූ අතර එම දේපළවල තක්සේරු කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබ ඇත. ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටු රැස්වීම් වලදී පැන නැගි ආරවුල් සහිත දේපළ ගැටලු නිරාකරණය සඳහා වූ විශේෂ රැස්වීම් වලට ද දෙපාර්තමේන්තුව සහභාගි විය.

2019 වසර තුළ පවරන ලද විශේෂ ව්‍යාපෘති

අංකය	වගකිව යුතු පළාත්බද නිලධාරීන්	ව්‍යාපෘති
1	කොළඹ නගරය	මැරයින් ඩ්‍රයිව් මාර්ග ව්‍යාපෘතිය
		ඔරුගොඩවත්ත අඹතලේ මාර්ග ව්‍යාපෘතිය
		කැළණිමුල්ල - කොස්වත්ත මාර්ගය
		කොළඹ - හොරණ මාර්ගය
		ශාන්ත සෙබස්තියන් උතුරු ඇල සංවර්ධන ව්‍යාපෘතිය
		කොම්පඤ්ඤ වීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය
		මට්ටක්කුලිය පාලම සංවර්ධන ව්‍යාපෘතිය
		ශ්‍රී ජයවර්ධන පුර - කොල්ලුපිටිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
		වේරැස්ගඟ සංවර්ධන ව්‍යාපෘතිය
		දෙහිවල කවුඩාන - අත්තිඩිය මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය
		කිරුළපන - ගොඩගම මාර්ගය
		නාරාහේන්පිට 2/1 පාලම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		පිටකෝට්ටේ - තලවතුගොඩ මාර්ගය
		ගාලු මාර්ගය , විජය මාර්ගය , වටරප්පල මාර්ගය සම්බන්ධීකරණ මාර්ග ව්‍යාපෘතිය
		කිත්තම්පහුව ඇල ව්‍යාපෘතිය
		නව කැළණිපාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය
		අලුත් මාවත භූගත උමං ජල මාර්ග ව්‍යාපෘතිය
		බේස්ලයින් මාර්ගය
		පාමංකඩ පාලම
2	බටහිර මධ්‍යම	කිරුළපන ගොඩගම මාර්ගය
		වේරැස්ගඟ ව්‍යාපෘතිය
		OPEC 2 මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
		පාර්ලිමේන්තු ගංඉවුර ව්‍යාපෘතිය
		කඩුවෙල - අතුරුගිරිය මාර්ගය
		මොරටුව - රාවතාවත්ත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
		කොට්ටාව - තලගලමාර්ගය
3	බටහිර උතුර	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
		කොළඹ - නුවර මාර්ගය
		කරස්නාගල ජලාශය
		කැලණිය - මුදුන්ගොඩ මාර්ගය
		කොළඹ පිටත වටරවුම් අධිවේගී ව්‍යාපෘතිය

		මාකොළ - උඩුපිල මාර්ගය
		කිරිඳිවැල නගර සංවර්ධන ව්‍යාපෘතිය
		මිරිස්වත්ත - වතුරුගම මාර්ගය
		ලංකා විදුලි බල මණ්ඩලය සඳහා වෙරළුගම්තොටුපොළ ඉඩම් අත්පත් කර ගැනීම
		හේකිත්ත - මීගමුව පාර
		කොළඹ - කටුනායක මාර්ගය
		ඔලියාමුල්ල ඇල පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		පැලියගොඩ අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගනය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
		වැලිසර නාවික කඳවුර නැවත පිහිටුවීමේ ව්‍යාපෘතිය
		රාගම රාජකීය දුම්රිය මාර්ග ව්‍යාපෘතිය
		ගණේමුල්ල ගුවන් පාලම ව්‍යාපෘතිය
		වැලිසර ගුණසේකර මාවත පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		හැඳල හුනුපිටිය 2/2 පාලම ව්‍යාපෘතිය
		දිවුලපිටිය ගුවන් හමුදා රේඩාර් සංඥා පද්ධතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
		මීරිගම - මීගමුව මාර්ගය
		දික්ඕවිට මත්ස්‍ය වරාය ව්‍යාපෘතිය
		මීරිගම - ගිරිඋල්ල මාර්ගය
4	බටහිර දකුණ	රුවන්පුර අධිවේගී මාර්ගය
		වාද්දුව - මොරොන්තුඩුව මාර්ගය
		කොට්ටාව - තලගල මාර්ගය
		බෙල්ලන - මොරගල මාර්ගය
5	ගාල්ල	මොරගොඩ ඇල සංවර්ධන ව්‍යාපෘතිය
		ගාල්ල බද්දේගම මාර්ගය
6	මාතර	දක්ෂිණ අධිවේගී මාර්ගය දිගුව
		මාතර - හක්මන මාර්ගය
7	දකුණ	දක්ෂිණ අධිවේගී මාර්ගය දිගුව
		මිරිජ්ජවිල සූරියවැව මාර්ග ව්‍යාපෘතිය
		ගොන්නෝරුව - බංඩගිරිය මාර්ගය
		මීගහජඳුර - හම්බන්තොට මාර්ගය
		ගොන්නෝරුව - හම්බන්තොට මාර්ගය
		වලස්මුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය
		වීරකැටිය නගර සංවර්ධන ව්‍යාපෘතිය
		ලංකා ආයෝජන මණ්ඩලය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
8	මධ්‍යම- I	මධ්‍යම අධිවේගී මාර්ගය අදියර - 3
		මොරගොල්ල - ජල විදුලි ව්‍යාපෘතිය
		වෙන්කලාඩි මාර්ගය

		පිච්චමල් වත්ත මාර්ගය
		මහනුවර - කිරිමැටිය මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය
		වයඹ ඇල ව්‍යාපෘතිය
9	මධ්‍යම- II	මොරගහකන්ද සහ කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය
		වයඹ පළාත් ගංගා ව්‍යාපෘතිය
		මධ්‍යම අධිවේගී මාර්ග අදියර III - IV
10	සබරගමුව	මහවැලි අධිකාරියේ ඉඩම
		දැරණියගල - දෙහිඕවිට මාර්ගය
		මධ්‍යම අධිවේගී මාර්ගය
		රුවන්පුර අධිවේගී මාර්ගය
		රත්නපුර ප්‍රතිවිරුද්ධ මාර්ගය
11	වයඹ	මධ්‍යම අධිවේගී මාර්ගය (IIකොටස්)
		මධ්‍යම අධිවේගී මාර්ගය (III කොටස්)
		මධ්‍යම අධිවේගී මාර්ගය (IV කොටස්)
		දැදුරු ඔය ජල විදුලි ව්‍යාපෘතිය
12	ඌව	උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
		තලපිටිගල ජලාශ ව්‍යාපෘතිය
		බදුල්ල - චෙන්කලාඩි මාර්ගය
		බදුල්ල ස්ප්‍රිංවැලි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
		මොණරාගල ජල විදුලි ව්‍යාපෘතිය
		මාලිංගොඩ ඇල ව්‍යාපෘතිය
		ලුණුගම්වෙහෙර බෙරලියෙල කතරගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
13	උතුරුමැද	පිබිදෙන පොළොන්නරුව ව්‍යාපෘතිය
		යාන් ඔය ව්‍යාපෘතිය
		ඉහළ මල්වතු ඔය ව්‍යාපෘතිය
		ඉහළ ඇලහැර ව්‍යාපෘතිය
14	උතුර	පෙරාරු ව්‍යාපෘතිය ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
		AB21 මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය
15	නැගෙනහිර	යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය
		රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය
		මුන්දනයාරු ගං ඉවුර ව්‍යාපෘතිය

2.11 අධ්‍යාපනික උන්නතිය

දැනුම, ආකල්ප හා කාර්යක්ෂමතාවය තේමාකර ගනිමින් සහ තිර ජීවන අධ්‍යාපනය තුළින් (Life Long Learning) සේවක අභිමානය යන මූලධර්මයත්, අභිප්‍රේරණය, කාර්ය සාධනය ඇගයීම සහ කුසලතා සංවර්ධනය තුළින් සේවක කාර්යක්ෂමතාව හා කැපවීම යන මූලධර්මයත් සැලකිල්ලට ගනිමින් 2006 වසරේදී නිපුණතා සංවර්ධන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී. තක්සේරු දෙපර්තමේන්තුව තුළ නිපුණතා සංවර්ධන කේන්ද්‍රය පිහිටුවා ඇත්තේ එහි සියලුම කාර්ය මණ්ඩලවල දැනුම වර්ධනය කිරීමේ පුළුල් පරමාර්ථයෙනි. මෙම නිපුණතා සංවර්ධන හා පුහුණු කේන්ද්‍රය තක්සේරු දෙපාර්තමේන්තුවේ ආරම්භයත් සමගම පුහුණු පාසලක් වශයෙන් බිහිවූ එකකි. පුහුණුව ආශ්‍රිත ක්ෂේත්‍රයෙහි ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනය වීම නිසා ඊට අදාළ සංකල්ප වෙනස් කිරීම් වලට භාජනය කෙරුණු අතර මෙම පුහුණු පාසල නව ප්‍රවනතා වලට ප්‍රතිචාර දක්වන නවෝත්පාදක වැඩසටහන් ඉදිරිපත් කරන්නාවූ විද්‍යායතනයක් බවට පත්විය. පසුගිය වසර කීපය මුළුල්ලේ මෙම විද්‍යායතනය මූල්‍යමය වශයෙන් ලාභදායි හා ලාභදායි නොවන පුහුණු වැඩසටහන් ගණනාවක් දෙපාර්තමේන්තුවේ ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා වූ කළමනාරණය වෙත ද, බාහිර පර්ශවයන් වෙත ද දියත් කර හරිනු ලැබ තිබේ.

දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ සිට සහයක ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය දක්වා විහිදී යන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම ආකල්ප හා කර්යක්ෂමතාව වර්ධනය කිරීම තුළින් වෘත්තීය විශිෂ්ඨත්වය ලඟාකර ගැනීමේ අරමුණු පෙරදැරි කරගෙන නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් පුහුණු වැඩසටහන් සංවිධානය හා මෙහෙයවීම සිදු කරයි.

නිපුණතා සංවර්ධනය කේන්ද්‍රය විසින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රධාන අංශ දෙකක් යටතේ පහත සඳහන් පරිදි වර්ගීකණය කළ හැකිය.

- අභ්‍යන්තර නිලධාරීන් සඳහා අභන්තර හා බාහිර පුහුණු වැඩසටහන් -
    - රැකියා නැඹුරුවක් සහිත පුහුණු වැඩසහන්
    - විෂය කේන්ද්‍රකොට ගත් පුහුණු වැඩසටහන් හා වැඩමුළු
    - විභාග ඉලක්ක කොටගත් පුහුණු සැසි හා වැඩමුළු
    - දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළු
    - ධනාත්මක ආකල්ප සහ ඵලදායිතා සැසි
- බාහිර නිලධාරීන් සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් -
    - පළාත් පාලන නිලධාරින් සඳහා පුහුණු සැසිවාර
    - පළාත් ආදායම් නිලධාරින් සඳහා පුහුණු සැසිවාර හා වැඩමුළු
    - දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි

අපේක්ෂකයන් සඳහා වෘත්තීය අනුබද්ධ වැඩසටහන්

- අත්කර ගැනීමේ නිලධාරින් සඳහා වන වැඩමුළු හා පුහුණු සැසිවාර
- අවශ්‍යතා අනුව විශේෂයන්ම සැකසුණු පුහුණු වැඩසටහන්
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය උපාධි අවසන් වසර සිසුන් සඳහා සීමාවාසික පුහුණු පාඨමාලාව

2019 වසර තුළ, මුළු වශයෙන් පුහුණු වැඩසටහන් 10 ක් ඊට සහභාගිවන්නන් 444 දෙනෙකු සඳහා ක්‍රියාත්මක කෙරුණි. සියලුම මට්ටමේ තනතුරු ආවරණය වන පරිදි අභ්‍යන්තර නිලධාරීන් සඳහා අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් 08 ක් පවත්වන ලදි. නිලධාරීන් 26 දෙනෙක් සඳහා බාහිර පුහුණු වැඩසටහන් 01 ක් පවත්වන ලදි. අවසන් වසර විද්‍යාවේදී දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය උපාධි පාඨමාලාවේ සිසුන් 45 දෙනෙකු සඳහා මූලික ක්ෂේත්‍ර පරීක්ෂණය ආරම්භ කිරීමේ සිට තක්සේරු වාර්තාව පිළියෙළ කිරීම දක්වා වන න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලිය ආවරණය වන පරිදි සීමාවාසික පුහුණු පාඨමාලා පවත්වන ලදි.

3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය 2019 වර්ෂය රු.	2018 වර්ෂය රු.	
150,000,000	**ආදායම ලැබීම්**				
150,000,000	ආදායම	1	121,435,816	142,902,142	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	121,435,816	142,902,142	ඒසීඒ -1
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3			
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4			
150,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		121,435,816	142,902,142	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		554,855,000	347,800,000	ඒසීඒ -3
-	තැන්පතු		54,325,516	161,818,091	ඒසීඒ -4
-	අත්තිකාරම් ගිණුම්		31,519,835	27,733,500	ඒසීඒ -5/5(ඒ)/5(බී)
-	වෙනත් ලැබීම්		22,514,574	18,155,718	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		663,214,925	555,507,309	
-	**මුළු ආදායම් ලැබීම් හා මුළු ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+ (ආ)**		784,650,741	698,409,451	
	අඩු කළා : වියදම				
	පුනරාවර්තන වියදම්				
319,100,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	316,899,143	286,950,008	ඒසීඒ -2(ii)
91,938,000	අනෙකුත් භාණ්ඩ හා සේවා සහනාධාර , සහනාධාර	6	88,934,452	80,083,413	
9,500,000	ප්‍රදාන සහ මාරු කිරීම්	7	9,311,001	9,379,799	
	පොළී ගෙවීම්	8			
	වෙනත් පුනරාවර්තන වියදම්	9			
420,538,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		415,144,596	376,413,220	

	මූලධන වියදම්				
	මූලධන වත්කම්				
12,440,000	පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම	10	6,707,382	8,537,731	ඒසීඒ -2(ii)
6,962,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	6,771,077	8,240,522	
-	ප්‍රාග්ධන පැවරීම්	12			
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13			
11,500,000	හැකියා වර්ධනය	14	11,284,904	11,158,782	
201,000,000	වෙනත් මූලධන වියදම්	15	200,991,388	114,628,000	
231,902,000	**මුළු මූලධන වියදම් (ඉ)**		225,754,751	142,565,035	
	ප්‍රධාන ලෙජර වියදම් (ඊ)		**127,909,415**	**150,249,493**	
	තැන්පතු ගෙවීම්		93,467,644	111,959,823	ඒසීඒ -4
	අත්තිකාරම් ගෙවීම්		768,808,762	38,289,699	ඒසීඒ -5/5(ඒ)/5(බී)
	මුළු වියදම උ = (ඇ+ඉ+ඊ)		**768,808,762**	**669,227,748**	
-	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ =(ඇ-උ)**		**15,841,979**	**29,181,703**	

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2019 තක්සේරු දෙපාර්තමේන්තුව

3.2 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2019 වර්ෂය රු.	2018 වර්ෂය රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	392,358,854	385,587,777
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5 (අ)	93,119,762	90,197,826
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		-
මුළු වත්කම්		485,478,616	475,785,603
<u>ශුද්ධ වත්කම්/ස්කන්ධය</u>			
ශුද්ධ වත්කම්		79,125,679	38,823,406
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		392,358,854	385,587,777
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(ආ)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	12,232,291	51,374,420
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	1,761,792	-
මුළු වගකීම්		485,478,616	475,785,603

පිටු අංක 06 සිට 27 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 28 සිට 36 දක්වා ඇතුලත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමේ සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරි	ගණන් දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මූල්‍ය) / කොමසාරිස් (මුදල්)
නම:	නම:	නම:
තනතුර:	තනතුර:	
දිනය:	දිනය: 28/05/2020	දිනය: 28/05/2020

S. R. Attygalle
Secretary to the Treasury and Secretary to the Ministry of Finance, Economy and Policy Development
The Secretariat
Colombo 01

ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව, 748, මරදාන පාර, කොළඹ 10.

පී.ඒ. තිලකරත්න
ප්‍රධාන ගණකාධිකාරී
තක්සේරු දෙපාර්තමේන්තුව
කොළඹ - 10.

27

3.3 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2019 වර්ෂය රු.	2018 වර්ෂය රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
මුළු බදු ලැබීම්			
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		121,435,816	142,846,104
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		22,514,574	347,800,000
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මඟින් එකතු කරන ලද ආදායම්		-	-
අග්‍රිම ලැබීම්		554,855,000	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		698,805,390	490,646,104
අඩු කළා : මුදල් වැය කිරීම්			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		404,365,395	411,346,936
සහනාධාර සහ මාරු කිරීම්		9,311,001	9,379,799
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		(995,965)	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		38	22,000,821
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		412,680,469	442,727,556
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)= (අ)-(ආ)		286,124,921	47,918,548
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
අත්තිකාරම් අයකර ගැනීම්		21,767,894	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		21,767,894	-

<u>අඩු කළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත් කර ගැනීම්	225,754,751	8,240,522
අත්තිකාරම් ගෙවීම්	24,801,228	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	250,555,979	8,240,522
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)= (ඇ)-(ඉ)	(228,788,085)	(8,240,522)
මෙහයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)= (ඇ)-(ඊ)	57,336,836	39,678,026
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	54,325,516	-
